# IM JAPAN - 指導文書 GW 号-

しどうぶんしょ

No.IM-TP31-10　April, 2020

実習生指導部　(Jisshusei Shido-Bu)

**තාක්ෂණික සීමාවාසිකයිනි, ඔබ ඉතා හොඳින් ඔබගේ සීමාවාසික පුහුණු කාලය කරගන යනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු. තව ටික දිනකින් Golden Week නිවාඩු කාලය. මෙවර දින 5ක නිවාඩුවක් වූවත්, ඔබගේ අයතනද ඔබට ඒ හා සම්බන්ධව නිවාඩු ලබාදෙන්නේනම්, සංචාර සඳහා පිටත්වීමට සූදානම් සීමාවාසිකයන්ද බොහෝමයක් සිටින බව අප විශ්වාස කරන්නෙමු. එබැවින් මෙම දීර්ග නිවාඩුවේදි පහත සඳහන් කරුනු පිලිබඳවද සැලකිලිමත් වන්න.**

## 1. නේවාසිකාගාරයෙන් පිටත්වීම සහ වෙනත් ස්ථානයක රාත්‍රිය ගත කිරීම සම්බන්ධයෙන් වැදගත් කරුණු

(1) ඔබගේ නේවාසික කාඩ්පත සහ IM Japan හැඳුනුම්පත සෑම විටම ඔබ ළඟ තබාගන්න. ඔබ නිවසින් බැහැරවන විට මෙම කාඩ්පත් දෙක ඔබ සන්තකයේ සෑම විටම තබාගැනීමට අමතක නොකරන්න. යම්කිසි අවස්ථාවකදී පොලිස් ප්‍රශ්න කිරීමකට ලක්වුවහොත් මෙම කාඩ්පත් ඉදිරිපත් කරන්න.

① නේවාසික කාඩ්පත

ආගමන විගමන පනතේ 23වන වගන්තිය අනුව ජපානය තුල ජීවත්වන විදේශිකයන් සෑම විටම සිය නේවාසික කාඩ්පත් ළඟ තබාගැනීමට අවශ්‍ය වේ. නේවාසික කාඩ්පත ළඟ ඇතිවිට ගමන් බලපත්‍රය ළඟ තබාගැනීමේ අවශ්‍යතාවක් නොමැත.

② IM Japan හැඳුනුම්පත

ඔබගේ ගමන් බලපත්‍රය, නේවාසික කාඩ්පත වැනි දෑ අස්ථානගත වුවහොත් හැකි ඉක්මනින් ඔබගේ ආයතනයට සහ IM Japan වෙත ඒ බව දැනුම් දෙන්න.

**(2) සංචාර සඳහා බැහැරවන විට දැනුම් දීමේ අයදුම්පත.**

ඔබ සංචාරයක් සඳහා හෝ වෙනත් අවශ්‍යතාවක් සඳහා නේවාසිකාගාරයෙන් බැහැරව යන විට ඒ බව දැනුම්දීමේ පත්‍රිකාව මගින් ඔබගේ ආයතනය දැනුවත් කල යුතුය. තවද නියමිත දිනට ඔබට ආපසු පැමිණීමට නොහැකි අවස්ථාවකදී ඒ බව හැකි ඉක්මනින් ඔබේ ආයතනයට දැනුම් දෙන්න. වෙනත් ආයතනයක සීමාවාසිකයන් හෝ පරිබාහිර පුද්ගලයෙකුට නවාතැන් සැපයීමේදීද ඔබගේ ආයතනය අදාල පත්‍රිකාව භාරදීම මගින් දැනුවත් කරන්න.

**(3) මාර්ග අනතුරු වළක්වාගැනීම**

ඔබ නිවසින් බැහැරවන අවස්ථාවලදී ජපානයේ නීති රීතීන් වලට අවනත වන්න. ජංගම දුරකථන භාවිතා කරමින්, ගීත වලට සවන් දෙමින් හෝ කුඩ භාවිතා කරමින් පාපැදි භාවිතය තහනම් ක්‍රියාවකි. මත්පැන් භාවිතා කොට පාපැදිය පැදවීමද නිති විරෝධී ක්‍රියාවකි. එමෙන්ම රාත්‍රී කාලයේදී පාපැදියෙන් ගමන් කිරීමේදී එහි විදුලි ලාම්පු දැල්වීමද අනිවාර්ය වේ.පා පැදි භාවිතයේදී සෑම විටම අදාළ නීතී පිළිපැදීමට බැඳීසිටින්න.

එමෙන්ම ඔබට ජපානයේ රියදුරු බලපත්‍රයක් නොමැති නිසා කිසිදු ආකාරයක මෝටර් රථයක් හෝ යතුරු පැදියක් පැදවීමට අවසර නොමැති බව මතක තබාගන්න.

**ටිකට්පතක් නොමැතිව දුම්රියේ ගමන් කිරීම නීතිවිරෝධී ක්‍රියාවකි.** දුම්රියේ ගමන් කිරීමේදී අදාළ ගාස්තු ගෙවා ටිකට්පතක් ලබාගන්න.



## 2. නිවාඩු කාලය ගත කිරීම

(1) ගිනි අනතුරු

සෑම විටම නිවසින් බැහැරවීමේදී විදුලිය සහ ගෑස් විසන්ධි කිරීමට මතක තබාගන්න. ආහාර පිසිමින් සිටින විටදී එම ස්ථානයෙන් නික්ම නොයන්න. එමෙන්ම දුම් දැමීමකදී ඉතාමත් සැලකිලිමත් වන්න. ගිනි ගැනීමකදී ගිනි නිවීමේ උපකරණයක් භාවිතා කරන්න. ඔබ පුහුණු මධ්‍යස්ථානයේදී හැදෑරූ ගින්නකදී අනුගමනය කරන පිළිවෙත් මතක් කොට "Kajida!!! Tasukete!!!" කියා හඬනගා පවසන්න. අනතුරුව 119ට ඇමතුමක් ලබාදෙන්න. සීමාවාසිකයෙකු සිතාමතා ගිනි පත්තුකිරීමක් සිදුකළහොත් එය අපරාධයක් ලෙස සළකන බැවින් ඒ පිළිබඳවද පරීක්ෂාකාරී වන්න.

(2) බැංකු, තැපැල් කාර්යාල සහ ATM යන්ත්‍ර වල රාජකාරී වේලාවන්

බොහෝ ATM යන්ත්‍ර සහ තැපැල් කාර්යාල නිවාඩු කාලය තුල වසනු ලබයි. එබැවින් ඔබට අවශ්‍ය මුදල් ඊට පෙර බැංකුවකින් ලබාගන්න. එමෙන්ම ATM යන්ත්‍ර සහ තැපැල් කාර්යාල නිවාඩු කාලය තුල වසා තබන කාලයද පරීක්ෂා කර බලන්න.



## 3. සෞඛ්‍ය සහ සනීපාරක්ෂාව

ජපානයේ ග්‍රීශ්ම ඍතුව පැමිනෙමින් පවතී. මේ කාලය තුලදී ඔබගේ ශරීර උෂ්ණත්වය පහළ යෑමක් සිදුවේ. එබැවින් පෝෂණය වැඩි ආහාර සෑම විටම ලබාගන්න. වර්ෂා කාලය තුලදී ආර්ද්‍රතාවය වැඩිවන බැවින් බැක්ටීරියා ක්‍රියාකාරීත්වය වැඩිවී ආහාර විෂවීම් වැඩි වශයෙන් ඇතිවිය හැක.

≪ආහාර විෂවීම් වළක්වාගැනීමට පහත පියවර අනුගමනය කරන්න. ≫

1. නැවුම් ආහාර ( මස්, මාළු වැනි දේ) මිළදී ගැනීමේදී කල් ඉකුත් වීමේ දිනය පරීක්ෂා කරබලන්න. 2. ඉක්මනින් ආහාර පිස, පිසූ ආහාර ඉක්මනින් භාවිතයට ගන්න. 3. ආහාර පිසීමට පෙර සබන් යොදා අත් හොඳින් සෝදන්න. ආහාර පිසීමෙන් අනතුරුව භාජන, පිහි වැනි දෑ ඩිටර්ජන්ට් යොදා හොඳින් පිරිසිදු කරගන්න.(උණු වතුර භාවිත විශබීජ නාශකයක් ලෙස ක්‍රියාකරනු ලබයි.) 4. මස් සහ මාළු වර්ග භාවිතයේදී ඉතා හොඳින් පිසූ දෑ පමණක් ආහාරයට ගැනීමට වගබලා ගන්න.

මෑත කාලයෙදී කොරෝනා වැනි බෝවන රෝග විශාල වශයෙන් පැතිරෙමින් පවතී. ඒ පිළිබඳව නිසි තොරතුරු පමණක් ලබාගෙන නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට සැළකිලිමත් වන්න.

## 4. මත්පැන් පානය සම්බන්ධව

වැඩිපුර පානය නොකිරීමට වගබලාගන්න. මත්පැන් විසින් ඔබට බොහෝමයක් ප්‍රශ්ණ ගෙනදේ. ඔබට කවරෙකු හෝ මත්පැන් පානය කිරිමට බල කරයිනම් එය ප්‍රතික්ෂේප කිරීමට නිර්භීත වන්න. යම් කිසි කෙනෙකු මත් වී සිටීනම් ඔහුව තනි නොකරන්න. යම්කිසි ගැටළුවක් පැන නැගුනු විටෙක ගිලන් රථයකට ඇමතුම් කරන්න.

## 5. නීති විරෝධී අන්දමින් රැකියාවල නිරත වීම. (අමතර රැකියා)

නිවාඩු කාලසීමාව තුලදී වෙනත් ආයතනයක් සඳහා සේවා සපයා මුදල් ලබාගැනීම තහනම් වේ. එය නීති විරෝධී ක්‍රියාවකි. නිවාඩු කාලය තුළදීද ඔබ සීමාවාසිකයෙකු යන බව සිහි තබාගෙන ඉතා හොඳින් හැසිරෙන්න.

## IM Japan ආයතනය සමඟ සම්බන්ධවීම්

連絡先(れんらくさき)は英語(えいご)のページにあります。

ඔබට යම්කිසි හදිසි අවස්ථාවකදී හෝ කරදරයක් සිදුවූ වුටදී IM Japan ආයතනයට, අදාළ ශාඛාවට හෝ ඔබගේ නියොජිතයාට ඉක්මනින් දැනුම් දෙන්න. ඔබ නිවාඩු දිනයක හෝ මධ්‍යම රාත්‍රීයේදී අමතනු ලැබුවහොත් එය ස්වයංක්‍රීයව හදිසි අවස්ථාවකදී සම්බන්ධවන පුද්ගලයාට සම්බන්ධවේ. පොදු දුරකථනයකින් ලබාගත හැකි ගාස්තු අයනොවන දුරකථන ඇමතුම් අංකයක්ද වේ